විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව- 2018

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රැස්කිරීමේ ගිණුමක (Collection Account) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.1,609,500 ක ශේෂය හා සම්බන්ධිත ලැබීම් ගිණුම්ගත කර නොතිබුණි. | සභාවේ අය කිරීමේ ගිණුමක් වන මෙම ගිණුමේ ශේෂය සෑම මසකම අවසාන දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 2323284 දරන ජංගම ගිණුමට මාරු කරනු ලැබේ. එහෙත්, මෙසේ මුදල් මාරු කිරීමේ දී 2018.12.31 දිනට අවසාන බැංකු ශේෂය මාරු වී ඇත්තේ 2019.01.01 දින වන විට වේ. ඒ අනුව අදාළ මුදල් 2019.01.01 දිනට ගිණුම් ගත කර ඇත. | ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ සියළු ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කළ යුතු වේ. |
| (ආ) | කොමිෂන් සභාවේ සංවර්ධන අරමුදලින් කාර්යසාධන ප්‍රකාශනයට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස රු.80,023,316 ක් මාරුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන වාර්තාවේ සත්‍ය ඌනතාවය වූ රු.5,319,171 ක් ගිණුම් | 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 10 (1) වගන්තිය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උපයන ආදායම මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංවර්ධන අරමුදල පිහිටුවා ඇති අතර විශ්වවිද්‍යාල පනතෙන් පැවරී තිබෙන කාර්යභාර කරගෙන යෑම සඳහා රජයේ අරමුදල් ප්‍රමාණවත් නොවන විට, එම අරමුදල කොමිෂන් සභාවේ අනුමැතිය මත භාවිතා කරනු ලැබේ. ඒ සඳහා විශ්වවිද්‍යාල පනතේ අංක 10 (3) වගන්තිය හා | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය මගින් වර්ෂයට අදාළ පුනරාවර්තන ආදායම් හා වියදම් පමණක් හඳුනා ගත යුතු අතර ඒ අනුව ඇතිවන අතිරික්තය හෝ ඌනතාවය අනාවරණය කළ යුතුය. |

| | |
|---|---|
| මගින් අනාවරණය නොකර රු.74,704,144 ක අතිරික්තයක් නිරූපණය කර තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ 2004.04.30 වන දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව වෙත බලතල පැවරී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.74,704,144 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.72,658,248 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,045,896 ක වර්ධනයක් විය. මෙම වර්ධනයට සංවර්ධන අරමුදලින් සාවද්‍ය ලෙස මාරු කරන ලද රු.80,023,316 ක් ආදායමට ගෙන තිබීම හා ප්‍රදාන හා වෙනත් හුවමාරු ලැබීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම වූ රු.2,457,100,115 පෙර වර්ෂයේ මෙහෙයුම් වියදම වූ රු.1,984,149,873 සමඟ සැසඳීමේදී රු.472,950,242 ක් හෙවත් සියයට 23 ක ඉහළයාමක් නිරීක්ෂණය විය. මෙසේ වියදමේ ඉහළයාමට මහපොළ ශිෂ්‍යාධාර වියදම රු. 410,512,250 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 2.07:1 ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 40 ක පහළයාමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017/2018 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම්ලත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 18 ක් වූ අතර පසුගිය අධ්‍යයන වර්ෂ 03 කදී විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 3,434 සිට 118 දක්වා අඩු මට්ටමක පැවතුණි. මේ අනුව අධ්‍යයනය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන්ගේ වැඩිවීමට සාපේක්ෂව විශ්වවිද්‍යාලයට | 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2016/2017 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 118 කින් අඩුවී ඇති ලෙස සටහන් වීම වෙනුවට 783 කින් වැඩිවී ඇති ලෙස නිවැරදි විය යුතුය.<br><br>එමෙන්ම, 2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම්ලත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාලවලට ඇතුලත් කිරීම සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 18 ලෙස සඳහන්ව ඇති ප්‍රමාණය සියයට 19 ලෙස නිවැරදි විය යුතුය. | රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පෙර වර්ෂයේ ඇතුළත් කර ගත් ප්‍රමාණයේ වැඩිවීමට සාපේක්ෂව වැඩි ප්‍රමාණයකින් ඉහළ දැමීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත් කර ගන්නා ශිෂ්‍යය සංඛ්‍යාවේ සාපේක්ෂ අඩුවීමක් දක්නට තිබුණි. | 2017/2018 වර්ෂයේදී 2016/2017 වර්ෂයට (71,106) සාපේක්ෂව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇති නිසා 2017/2018 (78,894) වර්ෂයේදී එම ප්‍රතිශතය අඩුවී ඇති ලෙස පෙන්නුම් කරයි. | |
| (ආ) | විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව සිසුන් ඇතුළත් කිරීමේදී විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම, ලියාපදිංචි වූ සිසුන් වෙනත් පාඨමාලාවලට මාරුවීම, වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා හැදෑරීම නිසා ලියාපදිංචිය අවලංගු කර ගැනීම සහ තවදුරටත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන ලෙස විශ්වවිද්‍යාලවලින් දැනුම්දීම යන හේතූන් මත 2017/2018 ආසන්නම අධ්‍යයන වර්ෂයේදී පුරප්පාඩු 897 ක් සහ 2014/2015, 2015/2016, 2016/2017 යන අධ්‍යයන වර්ෂ 03 කදී පිළිවෙළින් 738 ක් 2226 ක් හා 1455 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. | 2017/2018 අධ්‍යයන වර්ෂයේදී සාමාන්‍ය ප්‍රවේශය සහ පුරප්පාඩු පිරවීම් වට අටක් වශයෙන් වට නමයක් (09) ක්‍රියාත්මක කර ඇත.<br>පුරප්පාඩු පිරවීම් වටවලදී පවතින පුරප්පාඩු මුළු ප්‍රමාණයටම සිසුන් තේරීම සිදුකරන නමුත්, එසේ තේරීපත්වන සමහර සිසුන් නොයෙකුත් හේතූන් නිසා තේරීපත්වූ පාඨමාලාවල ලියාපදංචි නොවෙති. | විශ්වවිද්‍යාල වල පවත්වා ගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා රැකියා වෙළඳපල අවශ්‍යතාවයට ඉලක්ක වන පරිදි සංශෝධනය කලයුතු අතර රාජ්‍ය විශ්වවිද්‍යාල හැරයාම, ශිෂ්‍යයින් ලියාපදිංචි නොවී සිටීම යනාදීය අවම කිරීමට හැකි වන පරිදි ප්‍රමාදයකින් තොරව උසස් පෙළ ප්‍රතිඵල හා විශ්වවිද්‍යාල ප්‍රවේශ කඩඉම් ලකුණු නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය විශ්වවිද්‍යාල සඳහා විදේශ සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීමේදී යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 0.5 ක සිසුන් බඳවා ගැනීමට හැකි වුවද පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී යෝජිත හා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සැලකීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 09 ත් සියයට 50 ත් අතර පරාසයක පැවතුණි. | ඇතැම් පාඨමාලා සඳහා යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම සඳහා අයදුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම, බොහොමයක් පාඨමාලාවලට කිසිඳු අයදුම්පත්‍රයක් නොලැබීම, අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවීම. තේරීම් කමිටු සහ අදාළ පීඨමණ්ඩල සෑහීමකට පත්වන ප්‍රතිඵල අයදුම්කරුවන් විසින් ලබා නොගැනීම නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප වීම සහ යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාවට ඇතුළත්වන කොළඹ නගරයෙන් පිටත පිහිටි විශ්වවිද්‍යාලවලට ප්‍රවේශය ලැබීමට විදේශීය සුදුසුකම්ලත් සිසුන් කැමැත්ත නොදැක්වීම යනාදී කරුණු හේතු විය. | විදේශ සිසුන් සඳහා වෙන් කර ඇති සියයට 0.5 සඳහා සිසුන් බඳවා ගැනීමෙන් පසු තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා දේශිය සිසුන්ට ඇතුළත්වීමට අවස්ථාව ලබා දිය යුතුය. |
| (ඈ) | 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල වලට සිසුන් ඇතුළත් කිරීමේ අනුමැතිය ලබාදී තිබූ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තියට පරිබාහිරව කොමිෂන් සභාවේ තීරණයක් මත රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමන් විසින් කරන ලද ඉල්ලීමට පිළිතුරු වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලය 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා පවත්වන ලද කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාවෙහි ශිෂ්‍ය ලැයිස්තුව විශ්වවිද්‍යාල | දීප ව්‍යාප්තව පවත්වන අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ලබා ගන්නා ප්‍රතිඵල සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගත |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යාපන ආයතන 13 ක පවත්වා ගෙන යනු ලබන පාඨමාලා 25 ක් වෙනුවෙන්, උසස් පෙළ විභාගයේ ප්‍රතිඵලවලට අමතරව යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වා එම ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල වෙත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කිරීම ආරම්භ කර තිබුණි. එම ප්‍රතිපත්තිය කැලණිය විශ්වවිද්‍යාලයේ කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා ක්‍රියාත්මක කිරීම නිසා එම පාඨමාලාව සඳහා තෝරා ගත් අයගේ “z” අගයට වඩා වැඩි “z” අගයක් ලබා ගත් සිසුන් යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු 70 -82 අතර පරාසයේ සිටිය ද එවැනි සිසුන් 09 දෙනෙකුට මෙම පාඨමාලාව සඳහා ඇතුළත්වීමට අවස්ථාව අහිමි වී තිබුණි. | ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී. ඒ අනුව, එම ලැයිස්තුවෙහි සඳහන් සිසුන්ගේ Z-ලකුණු අනුපිළිවෙල, ඔවුන් පාඨමාලා සඳහා දක්වා ඇති කැමැත්තේ අනුපිළිවෙල සහ එක් එක් දිස්ත්‍රික්කයෙන් කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා වෙන් කර ඇති ස්ථාන සංඛ්‍යාව අනුව 2017/2018 අධ්‍යයන වර්ෂයේ කැලණිය විශ්වවිද්‍යාලයෙහි කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගැනීම සිදු කරන ලදී.<br>කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාවෙහි ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණයෙන් ලකුණු 70% හෝ ඊට වැඩියෙන් ලබාගත් සිසුන් පමණක් පරීක්ෂණය සමත් සිසුන් වශයෙන් සලකා බලන ලෙස කැලණිය විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඍජු දැනුම් දීමක් කර නොතිබූ හෙයින්ද, 2018 අගෝස්තු මස 9 වන දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 992 වන සභා වාරයේදී 2017/2018 අධ්‍යයන වර්ෂයේ කැලණිය විශ්වවිද්‍යාලයෙහි කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා තෝරාගත් සියලුම සිසුන්ට එම පාඨමාලාව හැදෑරීමට අවසර දෙන ලදී. | යුතුය. |
| (ඉ) | අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ ක්‍රමවේදය ආරම්භ වූ 2014/2015 අධ්‍යයන වර්ෂයේදී අන්තර්ජාලය හරහා මෙන්ම සාමාන්‍ය ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අවස්ථාව සලසා තිබුණි. එසේ වුවද 2017/2018 අධ්‍යයන වර්ෂය වනවිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමුකිරීම මෙන්ම තේරීපත් වූ පාඨමාලා සහ විශ්වවිද්‍යාල සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචි වීම ද අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත් කොට ඇත. මෙම පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂය දක්වා රු. 9,347,750 ක් වැයකර තිබූ අතර 2018 වර්ෂයේ සිට වසරකට රු. 700,000 ක නඩත්තු වියදමක් වැය | අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීම සඳහා 2014/2015 අධ්‍යයන වර්ෂයට වඩා 2015/2016 අධ්‍යයන වර්ෂයේදී ප්‍රවණතාවයක් සිසුන් විසින් දක්වා තිබූ නිසා ඒ තත්ත්වය සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීම අන්තර්ජාලය හරහා පමණක් සිදු කිරීමට තීරණය කරන ලදී.<br><br>2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන් විශ්වවිද්‍යාල සඳහා ලියාපදිංචි කර ගැනීමේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්තර්ජාලය හරහා පමණක් සිදු කරන ලදී. එහිදී සිසුන් පාඨමාලාවන්හි ලියාපදිංචි නොවීමෙන් ඇති වන පුරප්පාඩු ඉතා ඉක්මනින් ලබා ගත හැකි වූ අතර එමඟින් පුරප්පාඩු ඉතා ඉක්මනින් පිරවීමට | මාර්ගගත පද්ධතිය භාවිතා කරමින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අයදුම් කිරීමේදී අයදුම්කරුවන් මුහුණ දෙන ගැටළු අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට සිදුව තිබෙන බව නිරීක්ෂණය විය. මෙම ක්‍රමවේදය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී 2015/2016 අධ්‍යයන වර්ෂයේ දී 1081 ක්ව පැවති ගැටළු ප්‍රමාණය 2018/2019 අධ්‍යයන වර්ෂය වනවිට 5602 ක් දක්වා වැඩි වී තිබුණි. | හැකි විය. | |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

---------------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ---------------------------------- | ---------- |
| **(අ)** | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්වාගෙන යනු ලබන එකතුව රු.මිලියන 39.2 ක් වූ අරමුදල් ශේෂ වර්ෂ කිහිපයක සිට අක්‍රියව පැවතුණි. | පර්යේෂණ අරමුදල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.<br>*ත්‍යාග අරමුදල යටතේ ශිෂ්‍යත්ව පිරිනමන අරමුදල් 14ක් ඇත. 2018 වර්ෂය තුල දී ඒ යටතේ ශිෂ්‍යත්ව 30ක් පිරිනමා ඇති අතර අධ්‍යයන අංශය විසින් තව දුරටත් ශිෂ්‍යත්ව ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත.<br><br>*මධ්‍යම පර්යේෂණ අරමුදල වර්ෂ කිහිපයක සිට ම අක්‍රීයව පැවති බැවින් 2018.04.05 දින පැවති 984 වන සභා වාරයේ දී එහි ශේෂය පශ්චාත් උපාධි හැදෑරීම වෙනුවෙන් මූල්‍ය ආධාර ලබා දෙන වැය ශීර්ෂයට මාරු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.<br><br>*සුනාමි අරමුදල පිහිටු වන ලද අතර එම ශිෂ්‍යත්ව පිරිනැමී ම මේ වන විට අවසන් වී ඇත. ඒ අනුව 2018.07.12 වන දින පැවති 990 වන සභා වාරයේ දී මෙම අරමුදලෙහි ශේෂය විශ්වවිද්‍යාලය ශිෂ්‍යත්ව අරමුදලට මාරු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. | අරමුදලට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | අරමුදල් ගිණුම් 20 ක එකතුව රු.මිලියන 33.6 ක් ඌන උපයෝජිතව පැවතුණි. | Central Research අරමුදලෙහි ශේෂය 2018 වර්ෂයේ දී පශ්චාත් උපාධි ලබා දෙන වැය ශීර්ෂයට මාරු කිරීමට කොමිෂන් සභා අනුමැතිය ලබා දෙන ලදී. එබැවින් එම අරමුදලෙහි ශේෂය ආයෝජනය නොකල අතර ස්ථාවර තැන්පතුව 2019.01.17 දින කල් පිරුණු පසු එම වැය ශීර්ෂයට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුදලේ ඇති ශේෂයන් අදාළ අරමුණු වෙනුවෙන් යෙදවීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | Bond Violation අරමුදලෙහි ශේෂයෙන් 9 ක මුදලක් ආයෝජනය කොට ඇත.<br>Flood Relief අරමුදල ගංවතුර සහ නාය යෑම් වැනි ස්වභාවික ආපදා සඳහා දෙන ලද අරමුදල් ආපසු ගෙවන වාරිකවල එකතුව වේ. මේ පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසීමෙන් පසු ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ. දැනට මෙම මුදල් දෛනිකව Overnight Investment ලෙස ආයෝජනය කරනු ලැබේ.<br>ජාතික විද්‍යා පදනම සමඟ ඒකාබද්ධව UNESCO ආයතනය විසින් සකස් කොට ඇති මාර්ගෝපදේශයන්ට අනුව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සම්බන්ධව දර්ශනයන් සකස් කිරීම සඳහා National Science Fund පිහිටුවා ඇත. ඒ අනුව 2018 වර්ෂය තුල ව්‍යාපෘතියට අදාළ ගෙවීම් සිදු කොට ඇත.මෙය ජාතික විද්‍යා පදනම සමඟ එක්ව කරන ව්‍යාපෘතියක් බැවින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි මුදල් ආයෝජනය කරනු නොලැබේ. | |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 6.2.2 වගන්තිය ප්‍රකාරව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ හදිසි ප්‍රසම්පාදනයන් හැර සෙසු ලංසු කැඳවීමේ අවම කාලසීමාව දින 07 ක් ලෙස දක්වා ඇත. එසේ වුවද කොමිෂන් සභාව රු.762,805 ක් වටිනා ලිපිද්‍රව්‍ය අවස්ථා 02 කදී මිලදී ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2018.06.25 දාතමින් ලිපිද්‍රව්‍ය (A 4 කඩදාසි) මිලදී ගැනීම සිදු කරනු ලැබුවේ 2018.06.21 දාතමින් රේඛීය අමාත්‍යාංශය මගින් වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සූදානම්ව තබන ලෙස කරන ලද ලිඛිත දැනුම් දීම මත එම වාර්තාවල පිටපත් සකස් කර තැබීම සඳහාය. මෙම කටයුත්ත හදිසි අවශ්‍යතාවක් වූ බැවින් ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලියාපදිංචි සැපයුම් කරුවන් තුන්දෙනෙකුගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් ලබා ගෙන මෙම කාර්ය ඉටු කරන ලදී.<br>2018.10.03 දා තමින් ලිපිද්‍රව්‍ය (A 4 කඩදාසි) මිලදී ගැනීම සිදු කරනු ලැබුවේ අප ආයතනය යටතේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමානතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය විසින් පවත්වාගෙන යන "Study on ragging and sexual and Gender based on violence in the Sri | හදිසි කටයුතු සඳහා භාවිතා කිරීමට අවශ්‍ය වන තොග මට්ටම් පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | Lankan University System” ව්‍යාපෘතියේ මුල්‍ය දායකත්වය ලබා දුන් යුනිසෙෆ් ආයතනයේ දැනුම්දීම මත මුල්‍යාමය පියවීමේ කටයුතු 2018 ඔක්තෝබර් 09 දිනට ප්‍රථමයෙන් සිදුකළයුතු බැවිණි. | |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 2.14.1 වගන්තිය ප්‍රකාරව රු.500,000 කට වඩා වැඩි වටිනාකමකින් යුතු භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක් හරහා ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් සිදුකර 05 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවීමක් මඟින් සිදුකළ යුතුය. එසේ වුවද රු. 973,365 ක් වූ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රසිද්ධ ලංසු කැඳවීමකින් තොරව 2018 පෙබරවාරි 02 වැනි දින අවස්ථා 03 කදී ආයතන 10 ක් වෙත මිල කැඳවීම් ලිපි නිකුත් කර තිබුණි. | විගණන වාර්තාවේ දක්වා ඇති රු 973,365ක් වටිනා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම අවස්ථා 3කදී වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගෙන ප්‍රසම්පාදන අත්පොතේ අතිරේක 34 ප්‍රකාශනයේ අධිකාරී සීමාවන් ට යටත්ව මෙම කාර්යය ඉටුකරන ලද කාර්යයන්ය. මෙහිදී මෙම ප්‍රසම්පාදන කාර්ය සඳහා ආයතන 10ක් වෙත මිළගණන් කැඳවීම් යවා ආයතන 8කින් මුද්‍රා තැබූ මිල ගනන් ලැබී ඇත. මෙහිදී අදාළ මිලදී ගැනීම් හැමවිටම සිදු කර ඇත්තේ අවම මිල ගණන් සැපයුම් කරුවන්ගෙනි. මෙය ප්‍රසම්පාදන කාර්යයන් තුනක් ලෙස අදාළ අධිකාරී සීමාවන් තුළ අදාල අනුමැතීන් යටතේ සිදු කර ඇත. | එකම වර්ගයේ ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී වෙන් වෙන්ව ලංසු කැඳවීමට කටයුතු කිරීමකින් තොරව එකම ප්‍රසම්පාදන කටයුක්තක් සේ සලකා කටයුතු කළ යුතුය. |
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය විධිමත් අනුමැතියක් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම හැකිතාක් ඉක්මනින් සිදුකළ යුතු අතර ප්‍රසම්පාදන කාලසටහනේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත ලංසු ඇගයීමට ලක්කළ යුතුය. එසේ වුවද 2018/2019 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළව කැඳවා තිබූ මිල ගණන් විවෘත කිරීම 2018 පෙබරවාරි 14 දින සිදුකර තිබුණ ද එසේ විවෘත කරන ලද මිල ගණන් ඇගයීමට ලක්කොට තාක්ෂණ ඇගයීම් කමිටු තීරණය ලබාදීමට දින 100 කට ආසන්න කාලයක් ප්‍රමාද කොට තිබුණි. | 2018 පෙබරවාරි 14 දින මෙම ප්‍රසම්පාදනයේ මිල ගණන් විවෘත කළ ද 2018 පෙබරවාරි අවසන් සතියේ සිට අනධ්‍යයන කාර්ය මණ්ඩලය දින 60 කට වැඩි කාලයක් වැඩ වර්ජනයකට සහභාගීවීම හේතුවෙන් අදාල විෂයභාර ලිපිකරුවන්ගේ ලේඛන සහාය ලබා ගැනීමේ නොහැකිතාව මත මෙන්ම අදාළ මිල ගණන් කරුවන් පිළිබඳව සේවා පිළිබඳ රහස්‍ය වාර්තා ලබා ගැනීමට ඇතිවූ ප්‍රමාදයන් මෙන්ම සෙසු සම්පාදන කටයුතු ද වැඩවර්ජනයෙන් අනතුරුව එකවර කිරීමට සිදුවීම යන ප්‍රායෝගික හේතු මත මෙම ඇගයීම් ප්‍රමාදය සිදු ව ඇත. | කොමිෂන් සභාවට කාර්යක්ෂමව හා පිරිවැය අවම වන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කළ හැකි වන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාල පමාවකින් තොරව සිදුකර අදාළ කමිටු තීරණ ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි 2018/2019 වර්ෂයන්හි පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරවීම්, ලංසුකැඳවීම්, ලංසු විවෘත කිරීම්, ඇගයීමට ලක්කිරීම් යන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා පැවතුණි. එබැවින් නැවත ලංසු කැඳවා තුන්වන අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කිරීම නිසා පවිත්‍රතා සේවා කටයුතු සඳහා රු.1,812,873 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | 2018 වර්ෂයේ පවිත්‍රතා කටයුතු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලංසු කැඳවා තෝරා ගන්නා ලද ලංසුකරු ගිවිසුම් ප්‍රකාරව සතුටුදායක සේවයක් නොසැපයීම මත එම කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත්තුව කොමිෂන් සභාවේ අනුමැතියෙන් අවසන් කරන ලදී. | ලංසු මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් අතරින් සාර්ථක ලංසුකරු තෝරා ගැනීමේදී ඉදිරිපත් කරන ලද ලංසු මිලට අමතරව සමාන ආයතනවලට සපයන ලද සේවාවේ ඵලදායිබව, සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් සාර්ථක තීරණ ලබාදීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | පරිසනක 5 ක් මිලදී ගැනීම සඳහා 2017 වර්ෂයේදී මිල ගණන් කැඳවා, සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා දී තිබුණ ද ප්‍රසම්පාදන කමිටුව විසින් එම නිර්දේශය සැලකිල්ලට නොගෙන තාක්ෂණික ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයෙකු ඉදිරිපත් කර තිබූ තාක්ෂණික ගැටළුවක් මත අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත මිල ගණන් කැඳවීමට දී තිබූ නිර්දේශය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.මිලියන 1.2 ක් වැය කර මාස 10 ක් සඳහා කුලී පදනම මත පරිසනක ලබාගැනීම සිදුකර තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි දෙවන අවම මිල ගණන්කරුගෙන් කුලී පදනම මත පරිගණක ලබාගෙන නොමැත. පරිගණක කුලී පදනම මත ලබාගෙන ඇත්තේ අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Data Core Lanka (Pvt) Ltd. මගිනි. මෙම සියළු විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතුය. |